www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෝක ආර්ථික අර්බුදය, ධනවාදයෙහි අසාර්ථකත්වය හා සමාජවාදය පිලිබඳ ප්‍රශ්නය

## The world economic crisis, the failure of capitalism and the case for socialism

සමාජවාදී සමානතා පක්ෂය / ලෝක සමාජවාදී වෙබ් අඩවිය / සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ විසින් කැඳවන ලද කලාපීය සම්මේලනවල දී සම්මත කරගන්නා ලද යෝජනාව

Resolution of the SEP/WSWS/ISSE regional conferences

**2009 මැයි 21**

"ලෝක ආර්ථික අර්බුදය, ධනවාදයෙහි අසාර්ථකත්වය හා සමාජවාදය පිලිබඳ ප්‍රශ්නය" මැයෙන් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, සමාජවාදී සමානතා පක්ෂය හා සමාජ සමානතාවය වෙනුවෙන් ජාත්‍යන්තර ශිෂ්‍යයෝ යන සංවිධාන විසින් අනුග්‍රාහකත්වය දක්වන ලද සම්මේලන තුනක දී මතු දැක්වෙන යෝජනාව සාකච්ඡා කරන ලදුව ඒකමතිකව අනුමත කෙරින.

සම්මේලන පවත්වන ලද්දේ මිචිගන් ප්‍රාන්තයෙහි ඈන් ආබර්හි දී (අප්‍රේල් 25); නිව් යෝර්ක් නගරයෙහි දී (මැයි 3); හා කැලිෆෝනියා ප්‍රාන්තයෙහි ලොස් ඇන්ජලිස්හි දී (මැයි 10) ය. මෙම සම්මේලනවල දී යෝජනා කරන ලද ප්‍රතිශෝධන හා සංශෝධන මෙම ලියවිල්ල තුල අන්තර්ගත වෙයි.

1. 1930 ගනන්වල මහා අවපාතයෙන් අනතුරුව, ධනේශ්වර පද්ධතිය දැවැන්තම අර්බුදයට ඇතුලු වී තිබේ. මෙම අර්බුදයට කම්කරුවන් ප්‍රතිචාරය දැක්විය යුත්තේ සමාජවාදී විසඳුමක් ඉදිරිපත් කරමිනි. තවද, මෙම අර්බුදය ලොව පුරා සෑම රටකම වැඩ කරන ජනතාවට බලපාන ජාත්‍යන්තර අර්බුදයකි. ගෝලීය වශයෙන් ඒකාග්‍ර වූ ධනවාදයෙහි කඩා වැටීම සම්බන්ධයෙන් ජාතික වූ කිසිදු විසඳුමක් ඇත්තේ නැත. කම්කරු පන්තියෙහි නව සමාජීය හා දේශපාලන ව්‍යාපාරයක් වෙනුවෙන් පදනමක් වශයෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවිය, සමාජවාදී සමානතා පක්ෂය හා සමාජ සමානතාව වෙනුවෙන් ජාත්‍යන්තර ශිෂ්‍යයෝ යන සංවිධාන මතු දැක්වෙන වැඩ පිලිවෙල ඉදිරිපත් කරති.

2. "සමාජවාදී වැඩ පිලිවෙලක් පිලිගත යුත්තේ මන්ද?" යන පැනය ඉදිරිපත් කරන කම්කරුවන්ට අපි මෙසේ පිලිතුරු දෙමු: ධනේශ්වර පද්ධතිය අසාර්ථක වී ඇති නිසාය! සූරාකෑම, දුගීභාවය, මර්දනය, හා යුද්ධය හැරුනු විට, පවතින ආර්ථික පද්ධතියට ඉදිරිපත් කිරීමට අන් කිසිවක් නැත. යථාර්ථය සාක්ෂි දරන්නේ ඒ වෙනුවෙනි.

3. දෙවැනි ලෝක සංග්‍රාමය අවසන් වීමෙන් අනතුරුව ප්‍රථම වතාවට 2009 වසර තුලදී ගෝලීය ආර්ථිකය පිරිහීමකට මුහුනපා සිටී. සමාගම් වැසීයාමත් රැකියා අහිමි කිරීමත් සමග ම මේ වර්ෂය තුල ලෝව පුරා මිලියන 50කට අධික ජනතාවකට සිය පැවැත්ම අහිමි වනු ඇත. 2009 වසර තුල "නිදන්ගත සාගින්නෙන් පෙලෙන" සංඛ්‍යාව මිලියන 100කින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, මුලු සංඛ්‍යාව බිලියන එකේ සීමාව ඉක්මනින්ම පසු කර යනු ඇත.

4. එක්සත් ජනපදය තුල සෑම මසක් පාසාම ලක්ෂ සංඛ්‍යාත වූ රැකියා ප්‍රමානයක් අහෝසි කෙරේ. එක් වසරක් තුලදී පමනක් විරැකියාව හෝ ඌන සේවා වියුක්ති කම්කරුවන්ගේ සංඛ්‍යාව මිලියන 10 කින් වර්ධනය වී මිලියන 24කට ලඟා වී ඇත. නිල විරැකියාව සියයට 8.9ක් වන අතර බොහෝ ප්‍රාන්ත තුල එය සියයට 10 ඉක්මවා ගොස් ය. තථ්‍ය සේවා වියුක්තිය මෙයට වඩා බොහෝ සෙයින් වැඩිය. දස ලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ එක තැන පල්වෙන තත්ත්වයකට මුහුනපා සිටිති. ස්ථිර රැකියාවක් හා සෑහෙන වැටුපක් නොමැතිව, නිවෙස් වෙනුවෙන් ගෙවීම්, නයකර හා බිල්පත්, පවුල් වෙනුවෙන් සෞඛ්‍ය ආරක්ෂනය, සිය දූ දරුවන් වෙනුවෙන් අධ්‍යාපනය හෝ ජීවිතයේ වෙනත් මූලික අවශ්‍යතා සැපයීම ඔවුනට දැරිය නොහැක. අර්බුදය ගැඹුරුවත්ම ව්‍යාපාරික සංස්ථාවන් තව තවත් වැටුප් හා සහන අහෝසි වී යාම භාර ගන්නා ලෙස කම්කරුවන්ට කියා සිටියි.

5. තමන් මුහුන දෙන තත්ත්වයට කම්කරුවන් මත වරද පැටවිය නොහැක. ඒ වෙනුවට මෙම අර්බුදය ධනවාදය වෙතම එල්ල කෙරෙන චෝදනාවකි. එය දශක හතරක් ඈතට දිවයන ආර්ථික, සමාජීය හා

දේශපාලනික වර්ධනයක ප්‍රතිඵලය වේ. 1960 වසරෙහි මැද භාගයට අනතුරුව ඇමරිකානු ධනවාදයෙහි ගෝලීය තත්ත්වය විශ්මයජනක ලෙස පරිහානියට පත්ව ඇත. වරෙක එහි ආධිපත්‍යය දැරූ කර්මාන්ත යුරෝපයෙහි හා ආසියාවෙහි එහි ප්‍රතිමල්ලවයන් විසින් පසුපසට ඇද දමා ඇත. එයට ප්‍රතිචාරයක් වශයෙන්, සූරාකෑමෙහි මට්ටම වර්ධනය කරනු වස්, ඇමරිකානු කම්කරු පන්තියෙහි ජීවන තත්ත්වයන්ට හා සමාජ තත්ත්වයන්ට එරෙහිව ඇමරිකානු පාලක පන්තිය කුරිරු ප්‍රහාරයක් දියත් කොට ඇත. ඇමරිකානු ආර්ථිකයෙහි සම්පූර්න අංශ - බොහොමයක් නිෂ්පාදන කර්මාන්ත ද ඇතුලුව - ක්‍රමානුකූලව කඩා බිඳ දමා ඇත. මන්දයත්, ඒවා ප්‍රමානවත් ලාභ ගෙන නොදුන් හෙයිනි. රැකියා මිලියන ගනනින් විනාශ කොට ඇති අතර නාගරිකයන් පරිපූර්නව වනසා දමා ඇත. ඒ අතර වාරයේ, ලාභ ශ්‍රම උල්පත් හා වඩාත් ඉහල ලාභ සොයා යමින් ඇමරිකානු ප්‍රාග්ධනය ලෝක ගෝලය පීරා ගමන්ගෙන ඇත.

6. ඇමරිකානු නිෂ්පාදන කර්මාන්තවල කාලයක් තිස්සේ දිග්ගැසුනු පිරිහීම හා සංගත ලාභ උපදවන ප්‍රධාන මූලය ලෙස ආයෝජන බැංකු පද්ධතියේ හා මූල්‍ය සමපේක්ෂනයේ වර්ධනය වීම මූල්‍ය කතිපයාධිත්වයක් තුල බලය එක්තැන් කිරීමට මං පෑදීය. මේ මූල්‍ය කතිපයාධිකාරය ඇත්ත වශයෙන්ම දේශපාලන හා ආර්ථික ප්‍රතිපත්ති තීරනය කරයි. ඇමරිකානු වෙලඳපොලවල හා එක්සත් ජනපද ඩොලරයෙහි වරප්‍රසාදිත තත්ත්වය මත පදනම් වෙමින් සිය පරපුටු සමපේක්ෂනයන් සඳහා අරමුදල් සපයාගැනීමට ලොව වටා රටවලින් සම්පත් නයට ගැනීමට මේ කතිපයාධිකාරයට හැකිවී තිබේ. මෙම කටයුතු, කිසිදු මූර්ත අගයක් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ගත්කල වඩ වඩාත් ඉවතට ගමන් කරමින් තිබේ. එක්සත් ජනපදයෙහි නයගැතිකම ඉමහත් ලෙස වර්ධනය වීම ද ඇතුලුව, ලෝක ආර්ථිකයෙහි ගැඹුරු ව්‍යුහාත්මක අසමතුලනයන් මෙම ක්‍රියාවලිය මගින් ජනිත කොට ඇත.

## ඔබාමා පාලන තන්ත්‍රය

7. එක්සත් ජනපදයේ නායකත්වය යටතේ ලොව පුරා ආන්ඩු මෙයට ප්‍රතික්‍රියා කොට ඇත්තේ අර්බුදයට වගකිව යුතු පුද්ගලයින්ගේ ම එල ප්‍රයෝජන ආරක්ෂා කිරීමෙනි. එන්ට එන්ටම නොසැලකිලිමත් ලෙස ඩොලර් ට්‍රිලියන ගනන්වලින් සහන පිදීම් වශයෙන් මුදල් යෙදවීමේ වැඩ පිලිවෙල් පිටුපස ඇත්තේ අන් සියල්ල අභිබවා යන එක් ඕනෑකමකිඃ එනම්, විශාල බැංකුවල හා පොහොසත් ආයෝජකයින්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමයි.

8. 2008 සැප්තැම්බරයෙහි දී, මූල්‍ය අර්බුදය පුපුරා ගිය අවස්ථාවේ දී, ඩිමොක්‍රටික් පක්ෂයේ ද සහාය ඇතිව, බුෂ් පාලන තන්ත්‍රය බැංකුවලට දැවැන්ත සහන පිදීමේ මුදල් සම්පාදන වැඩ පිලිවෙලක් සංවිධානය කලේය - වටිනාකම් ක්ෂය වී ගිය වත්කම් සතු බැංකු අරභයා ඇරඹූ එම සහන වැඩ පිලිවෙලට (ටාර්ප්) ඩොලර් බිලියන් 700ක් යොදවනු ලැබුනි. එසේ වුව ද, මෙම අරමුදල් බැංකු "සම්පූර්නයෙන් ගොඩගැනීමට" ප්‍රමානවත් නොවී ය - එනම්, බැංකුවල සමපේක්ෂන ආයෝජන කඩාවැටීම මගින් නිර්මානය කරන ලද හිඩැස පිරවීමට ප්‍රමානවත් නොවී ය. ඔබාමා පාලන තන්ත්‍රය අමතරව නව පියවර මාලාවක් ඇරඹී ය. බැංකු ශේෂපත්‍රවල "විෂවූ වත්කම්" (toxic assets) මිලයට ගැනීම සඳහා පෞද්ගලික අනාගත සුරැකුම් අරමුදල්වලට ඩොලර් ට්‍රිලියනයක සහනාධාරයක් සැපයීම ද මෙයට ඇතුලු විය.

9. සහන ලෙස පිරිනැමූ මුදල් ලබා ගත් බැංකු යලි නයදීම අරඹා ඇමරිකානු පාරිභෝගිකයනට හා කුඩා ව්‍යාපාරවලට සහාය වනු ඇතැයි ඔබාමා ප්‍රකාශ කරයි. මෙය සිදුවී නැත. සිය ශේෂපත්‍ර පියවීම, සංගත පවරාගැනීම්වලට මුදල් යෙදවීම හා සත්තකින් ම අති විශාල විධායක වැටුප් හා බෝනස් මුදල් ගෙවීම සඳහා ද බැංකු මේ බදු ගෙවන්නන්ගේ මුදල් උපයෝගි කර ගනිති.

මේ සහන ලෙස මුදල් යෙදවීම්වලට මිල අවසානයෙහි දී ගෙවිය යුතු වන්නේ කම්කරු පන්තිය මත එල්ල කරන ප්‍රහාර හා සමාජ ආරක්ෂාව, සෞඛ්‍ය ආරක්ෂාව හා සෞඛ්‍ය ආධාර ඇතුලු මූඛ්‍ය සමාජ වැඩ පිලිවෙල් කපා හැරීම මගිනි.

10. මූල්‍ය කර්මාන්ත විධායක නිලධාරින්ගේ බෝනස් මුදල් ගෙවීම වෙනුවෙන් පෙනී සිටිමින් ඔබාමා පාලන තන්ත්‍රය ගිවිසුම් පත්‍රවල "අනුල්ලංඝනීය භාවයෙහි" පිහිට පතයි. එසේ වුව ද, මේ ප්‍රතිපත්තිය කම්කරුවන්ට බලනොපායි. එක්සත් ජනපද මෝටර් කර්මාන්ත සමාගම් "ලාභ උපයන" තත්ත්වයට පත් කිරීම සඳහා මෝටර් කර්මාන්ත කම්කරුවන් සිය වැටුප්, රැකියා හා ප්‍රතිලාභ අරභයා නව කප්පාදු වැඩ පිලිවෙල පිලිගත යුතු බවට ඔබාමා බලවත් සේ ඉල්ලීම් කර ඇත. එහි අරුත නම්, මෙම කම්කරුවන් ආයෝජකයින්ට ප්‍රමානවත් හා අඛන්ඩ ඉපැයුම් අනුපාතිකයක් සැපයීමට සහතික විය යුතුය යන්නය. මේ නිර්ලජ්ජිත දෙබිඩි ප්‍රමිතිය පිටුපස ඇත්තේ ආන්ඩුව ඉටුකරන්නේ පාලක පන්තියෙහි අවශ්‍යතාවන්ය යන දේශපාලන සිද්ධාන්තය යි. කම්කරුවන්ට මෙහි ගම්‍යයන් විනාශකාරී වේ. රැකියා 23,000ක් අහෝසි කිරීමේ සැලසුම් ජෙනරල් මෝටර්ස් සමාගම නිවේදනය කර ඇත. ක්‍රයිස්ලර් සමාගම සිය බංකොලොත් බව ප්‍රකාශයට පත් කර ඇති අතර යටත් පිරිසෙයින් කම්හල් අටක් වසා දමනු ඇත. මෙය වැටුප් හා ප්‍රතිලාභ විශාල ලෙස කපාහැරීමට අමතරය.

11. විදේශීය හා යුද ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ද ඔබාමා, පාලක පන්තියෙහි අවශ්‍යතාවන් වෙනුවෙන්

පෙනී සිටී. ඉරාකයෙහි මිලිටරි වාඩි ලා ගැනීම තව දුරටත් පවත්වා ගෙන යයි. ඇෆ්ගනිස්ථානයෙහි ජනතාව මත ලේ වැකි ප්‍රහාර එල්ල කරනු වස් නව ජනාධිපති එරට වෙත දස දහස් ගනන් වැඩිපුර එක්සත් ජනපද හමුදා පිටත් කර යවා ඇත. ඔහු පකිස්ථානය වෙත ප්‍රහාර එල්ල කිරීම වැඩි කරමින් සිටී. එය එම රට අස්ථාවර කිරීමේ තර්ජනයට ලක් කොට වඩාත් පුලුල් යුද්ධයකට පොලඹවයි. සමාජ වැඩපිලිවෙල් පුලුල් ලෙස කපා දැමිය යුතු බවට අවධාරනය කරන ඔබාමා මේ වර්ෂය තුල දී යුද වියදම් ඩොලර් බිලියන 640ක් දක්වා ඉහල දමා ඇත. ඒ අතර වාරයේ ම බුෂ් පාලන තන්ත්‍රය විසින් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මත එල්ල කරන ලද ප්‍රහාර මෙම පාලන තන්ත්‍රය ද තව දුරටත් එලෙස ම පවත්වාගෙන යයි. ඒ සමග ම ජාත්‍යන්තර හා අභ්‍යන්තර නීති රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ ආන්ඩුවේ නිලධාරින්ට එරෙහිව නඩු පැවරීමට මෙම පාලන තන්ත්‍රය විරුද්ධ වන අතර යුද අපරාධ ලේඛනගත කරන ජායාරූප නිකුත් කිරීම අවහිර කිරීමට වෙර දරයි.

12. ඔබාමා 2008 වසරේ මැතිවරනය ජයග්‍රහනය කලේ, බුෂ් පාලන තන්ත්‍රයට එරෙහි පොදු ජන විරෝධය හා "වෙනසට" ඇති අභිලාෂය කෙරේ ආයාචනය කිරීම් තුලිනි. එසේ වුව ද, නව පාලන තන්ත්‍රයෙහි පන්ති ස්වභාවය වඩවඩාත් විවෘතව ඉස්මතු වෙමින් තිබේ. කම්කරු පන්තිය ඩිමොක්‍රැටික් පක්ෂයට හා ද්වීපාක්ෂික ක්‍රමයට තව දුරටත් බැඳී තිබෙන තාක් කල් කිසිවක් වෙනස් කල නොහැකි බව නව පාලනයෙහි ක්‍රියාවන් තුලින් විදහා දැක්වේ.

## කම්කරු පන්තිය මෙහෙයවීම උදෙසා

13. සිය අවශ්‍යතාවන් ආරක්ෂා කර ගැනීම සඳහා අර්බුදයට කම්කරුවන් තමන්ගේ ම විසඳුමක් ඉදිරිපත් කල යුතු ය. මෙහි අරුත වන්නේ පෙලපාලි, වැඩ වර්ජන, කම්හල් වාඩි ලා ගැනීම් හා වෙනත් ආකාරයේ කම්කරු අරගලවලට එලඹීමයි. මෙම අරගලවලින් තොරව, සිය රැකියාවන්ට හා ජීවන තත්ත්වයන්ට එරෙහිව එල්ල වන අඛන්ඩ ප්‍රහාරයට විරෝධය පෑමේ වෙනත් මගක් ඇත්තේ නැත.

14. කම්කරු පන්තිය සෑම සහනයක්ම දිනාගෙන ඇත්තේ අරගල තුලිනි. දිනකට පැය අටේ වැඩ මුරය හා ලමා ආරක්ෂන නීති වෙනුවෙන් 1870 ගනන්වල කල අරගලයන්හි සිට 1930 ගනන්වල සමූහ වැඩ වර්ජන කාර්මික වෘත්තීය සමිති සංවිධානය කිරීමේ අයිතිය වෙනුවෙන් කල සටන් දක්වා ද හා ඉන් ඔබ්බට, වාර්ගික සමානතාව හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් වෙනුවෙන් කල සටන් දක්වා ද යනාදී වශයෙන් කම්කරු පන්තිය මේ සියල්ල මුදුන් පත් කර ගෙන ඇත්තේ අරගල තුලිනි. 1930 ගනන්වල මහා අවපාතය, සාමූහික ක්‍රියාකාරකම් රැල්ලකට මං පෑදීය. 1932 වසරෙහි බෝනස් වෙනුවෙන් පෙලපාලි, 1934 වසරෙහි මිනියපොලිස්හි දී (ලොරි රියදුරන්ගේ), ටොලෙඩෝහි දී (මෝටර් රථ කර්මාන්තයෙහි නියැලි කම්කරුවන්ගේ) හා සැන්ෆ්‍රැන්සිස්කෝහි දී (වෙරලාසන්න සේවාවල නියුතු කම්කරුවන්ගේ) සමූහ වැඩ වර්ජන ද, එක්සත් මෝටර් කාර්මික කම්කරු සංවිධාන ගොඩනැගීමට මූලික වූ 1936-37 වසරවල මිචිගන් ප්‍රාන්තයේ ෆ්ලින්ට්හි දී මහා වාඩි ලා ගැනීමේ වැඩ වර්ජන ද මේ සමූහ අරගලවලට ඇතුලත් ය. 1950, 1960, හා 1970 ගනන් පුරා සාමූහික කම්කරු පන්ති වැඩ වර්ජන, ඇමරිකානු දිවියෙහි පොදු අංගයක් විය.

15. එසේ වුව ද, පසුගිය වසර තුල, එක්සත් ජනපදය තුල විවෘත පන්ති අරගල නැත්තටම නැති තරම් විය. මෙයට හේතුව පන්ති එදිරිවාදිකම්වල හෝ සමාජ ආතතීන්ගේ හීන වීම නොවේ. ඇත්ත වශයෙන්ම, මෙම කාල පරිච්ඡේදය තුල සමාජ අසමානතා දැවැන්ත ලෙස වර්ධනය වී ඇත. අන් සියල්ලටම වඩා, මෙයට හේතුව කම්කරු පන්තිය නියෝජනය කරන්නේ යයි කියනු ලබන පැරනි සංවිධානවල බංකොලොත් බවයි. අද දින ඒඑෆ්එල්-සීඅයිඕ හා "ජයගැනීම සඳහා වෙනස සංධානය" තුල සංවිධානය වී සිටින නිලධාරිවාදී සංවිධාන - මේවා වෘත්තීය සමිති වන්නේ නමින් පමනි - කම්කරුවන් මත සංගත ප්‍රහාරවල හවුල්කරුවන් ලෙස ක්‍රියා කරති.

16. මේ සංවිධාන බොහෝ කලකට පෙර ධනේශ්වර පද්ධතිය සමග සංහිඳියාවක් ඇති කරගෙන ඇත. දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසුව ඇති වූ තත්ත්වය මත, රජයේ සහාය ඇතිව, කම්කරු නිලධාරි පෙලැන්තිය, සටන්කාමීන් හා සමාජවාදීන් නෙරපාහැරීමට සංවිධානාත්මකව කටයුතු කලේ ය. සටන් කාමීන් සහ සමාජවාදීන් වූ කලි වෘත්තීය සමිති ගොඩනැගීමෙහි ලා පුරෝගාමී වූ පිරිස් වේ ආර්ථික ක්‍රමයෙහි රැඩිකල් වෙනසක් හෝ කර්මාන්ත ශාලාවල හා වැඩපොලවල සංගත පාලනය හා කලමනාකරනය වෙත තර්ජනයක් නොමැතිව, ධනේශ්වර රාමුව තුල කම්කරුවන්ගේ අවශ්‍යතාවන් සපුරා ලිය හැකි යයි ඔවුහු කියා සිටියහ. සිය ජාතිකවාදී දැක්මෙහි කේන්ද්‍රීය කොටසක් වශයෙන් රටින් පිට පාලක පන්තියේ අවශ්‍යතාවන් ඉදිරියට ගෙන යෑම සඳහා සිය සේවාව ලබා දෙමින්, වෘත්තීය සමිති නිලධාරි පෙලැන්තිය ඇමරිකානු යුදවාදයට සහායවීය.

17. දශක තුනකට පෙර කම්කරු පන්තියට එල්ල කරන ලද මහා සංගතයන්හි මූල්‍ය ප්‍රහාරයට වෘත්තීය සමිති නිලධාරි පෙලැන්තිය ප්‍රතිචාර දැක්වූයේ කලමනාකරන ව්‍යුහය තුලට තවතවත් ඇලීගැනීමෙනි. 1980 ගනන්වල සිට, සෑම ප්‍රධාන වැඩ වර්ජනයක් ම හුදකලා කිරීමටත් පාවාදීමටත් වෘත්තීය සමිති නායකත්වය සවිඥානිකව ක්‍රියා කලේ ය. ඉන් අනතුරුව, කම්කරු පන්තිය මත එල්ල වන ප්‍රහාරය තීව්‍ර වන තත්ත්වයක් තුල පවා වැඩ වර්ජන සංඛ්‍යාව

විශ්මය ජනක ලෙස පහත වැටී ඇත. වෘත්තීය සමිති එකඟ වූ සෑම ගිවිසුමක දී ම වැටුප්, ප්‍රතිලාභ හා රැකියා සම්බන්ධයෙන් හාම්පුතුන්ට වැඩි වාසි සලසා ඇත. මේ සංවිධාන තව දුරටත් "වෘත්තීය සමිති" ලෙස හැඳින්විය නොහැක. කම්කරු පන්තියට තිරිංග දමමින් ද සමාජ කැලඹීම් මෙල්ල කරමින් ද හාම්පුතුන්ට වාසි සලසමින් ද මේ සංවිධාන සංගත කලමනාකාරිත්වයේ ශාඛාවන් ලෙස ක්‍රියාත්මක වෙයි. මෝටර් රථවාහන කම්කරුවන් මත එල්ල කෙරෙන වර්තමාන ප්‍රහාරයේ කොටසක් වශයෙන් ක්‍රයිස්ලර් හා ජෙනරල් මෝටර්ස් යන සමාගම් දෙකෙහි ම ප්‍රධාන අයිතිකරු යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය වනු ඇත. එමගින් තමන් නියෝජනය කරන්නේ යයි කියනු ලබන කම්කරුවන් සූරාකෑමෙහි ලා සෘජු අවශ්‍යතාව එම සංවිධානය තුලින්ම හට ගනු ඇත.

18. ඒ සමග ම, කම්කරු පන්තිය ධනේශ්වර ක්‍රමයට හා එහි දේශපාලන නියෝජිතයන්ට, විශේෂයෙන්, ඩිමොක්‍රැටික් පක්ෂයට යටත් කිරීමට මේ සංවිධාන ක්‍රියා කර තිබේ. ධනේශ්වර පන්තිය සමග සිය සහයෝගිතාව වර්ධනය කිරීම හැරුනු විට, වර්තමාන ආර්ථික අර්බුදය කෙරෙහි එම සංවිධාන ප්‍රතිචාර දක්වා ඇත්තේ එක්සත් ජනපදය තුල කම්කරුවන්ගේ අවශ්‍යතාවන් ආරක්ෂා කල හැක්කේ ඔවුන් සංක්‍රමනික කම්කරුවන්ට හා වෙනත් රටවල කම්කරුවන්ට එරෙහිව තරග කිරීමෙන් ය යන ජාතිකවාදී මුසාව ප්‍රවර්ධනය කිරීම ලෙස ය.

19. හාම්පුතුන්ට වාසි හා කම්කරුවන්ට පරාජය අත්කර දීමේ දශක ගනනාවක් පුරා පැතිර ගිය මෙම කාල පරිච්ඡේදය කම්කරුවන් විසින් අවසානයකට ගෙන ආ යුතුය. පන්ති අරගලය යලි ඇරඹීම සඳහා මෙම පැරනි සංවිධානවලින් තීරනාත්මකව බිඳී වෙන්වීම අවශ්‍යවේ. ස්වාධීන කම්කරුවන්ගෙන් සමන්විත වැඩපොල කමිටු හා අසල්වැසි හා තරුන කමිටු ඇතුලු, නව සංවිධාන ගොඩනගන ලෙස අපි ඉල්ලා සිටිමු. මෙම සංවිධාන, අව්‍යාජ ප්‍රජාතන්ත්‍රීය තීරන ගැනීමේ හා ජනතා ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ කේන්ද්‍රස්ථාන බවට පත්විය යුතුය. සංස්ථාවන්ට හා යූඒඩබ්ලිව් සංවිධානය තුල ඒවායේ හවුල්කරුවන්ට එරෙහි ජනතා ප්‍රතිරෝධය සංවිධානය කිරීම සඳහා සාමාන්‍ය කම්කරුවන්ගෙන් සමන්විත විරුද්ධවාදී සම්බන්ධීකරන කමිටුවක් ගොනැගීම අරඹන ලෙස අපි, විශේෂයෙන්ම මෝටර් රථ කර්මාන්තයෙහි නියැලි කම්කරුවන්ගෙන් උදක්ම ඉල්ලා සිටිමු.

## කම්කරු පන්තිය වෙනුවෙන් දේශපාලන වැඩපිලිවෙලක්

20. පන්ති අරගලය යලි ඇරඹීම වැදගත්ම හා අවශ්‍යතම කාර්යයයි. එසේ වුව ද, එය සාර්ථක වන්නට නම් දේශපාලන මූලෝපායක් සහිතව එය මෙහෙයවිය යුතු ය. එහි ආරම්භක ස්ථානය විය යුත්තේ මෙම අරගලය පෞද්ගලික ලාභයෙහි අවශ්‍යතාවන් වෙනුවෙන් කම්කරු පන්තිය සූරාකෑම මත පදනම්වූ ධනේශ්වර ක්‍රමයට එරෙහි අරගලයක් ලෙස පිලිගැනීමය.

21. ලෝක ආර්ථිකයේ මූලික සංවිධානයෙහි ව්‍යුහයේ විපර්යාසයක් අවශ්‍ය ය. මානවයාගේ ඉමහත් නිෂ්පාදන බලවේග ප්‍රකෝටිපතීන්ගෙන් සමන්විත ඉතා කුඩා ස්තරයකට යටත් කිරීමට තව දුරටත් ඉඩ තැබිය නොහැක. පෞද්ගලික ලාභ ගැරීම නොව, සමාජීය අවශ්‍යතා සපුරාලීම සඳහා ආර්ථික දිවියෙහි සමාජවාදී ප්‍රතිසංවිධානයක් තුලින් පමනක් කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනතාවට වද දෙන ගැටලුවලට විසඳුමක් සොයාගත හැකි වනු ඇත.

## කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව උදෙසා

22. අර්බුදයට කම්කරු පන්තියේ අවශ්‍යතාවන්ට අදාලවන විසඳුමක් ලබා ගත හැක්කේ ජාත්‍යන්තර මට්ටමකින් පමනි. ඉතිහාසයේ අන් කවර අවධියකටත් වඩා ලෝක ආර්ථිකය අද දින වඩාත් සමීප ලෙස ඒකාග්‍රව ඇත. මෙම ගෝලීය ඒකාග්‍රවීම මානවායාගේ ජීවන තත්ත්වයන්හි අතිමහත් සංවර්ධනයක් ඇති කිරීමට පදනමක් සපයයි. එසේ වුව ද, මෙම ඒකාග්‍රවීම සංගත ප්‍රභූවෙහි විවිධ කොටස්වල ජාතිකවාදී අවශ්‍යතාවන් හා ගැටේ. සිය අවශ්‍යතා ආරක්ෂා කිරීමට උත්සුක වන ඔවුහු තම රැකියා සුරක්ෂිත කර ගැනීම සඳහා වෙනත් රටවල කම්කරුවන්ගේ රැකියාවන්ට පහර එල්ල කිරීම අවශ්‍යය යන විශ්වාසය කම්කරුවන් තුල මුල්බැස්සවීමට අනුබල දෙති. මෙය මුසාවකි. වැඩ කිරීමට හැකියාව ඇති සෑම අයෙකුගේ ම ශ්‍රමය මගින් සපුරාලිය යුතු උවමනාවන් අඩුවක් නැත.

23. එක්සත් ජනපදයෙහි කම්කරුවන් මුහුන දෙන කිසිදු ගැටලුවක් ජාතික තලයෙහි විසඳ ගත නොහැක. ආර්ථික කඩා වැටීම, යුද්ධය, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව එල්ල කෙරෙන ප්‍රහාර, සූරාකෑම, සේවාවියුක්තිය, දුගීභාවය හා පරිසර විනාශය යන මේ සියල්ල හුදෙක් ඇමරිකාවට සීමාවුනු ගැටලු නොවේ. ඒවා ගෝලීය විසඳුම් අවශ්‍ය කරවන ලෝක පරිමානයේ ගැටලු වේ. එකම හා සැබැවින්ම ජාත්‍යන්තර වූ පන්තිය කම්රු පන්තිය යි. සියලු ජාතික

සීමා ඉක්මවා යන ආසක්තයන් සහිත එකම පන්තිය එයයි. එක්සත් ජනපදයෙහි කම්කරුවන්ට සංගත හා මූල්‍ය ප්‍රභුවෙහි බලයට එරෙහිව සටන් කලහැක්කේ සෑම රටකම කම්කරුවන් සමග සමීපතම සහයෝගීතාව ගොඩනැගීම තුලින් පමනි.

## හදිසි සමාජ හා පොදු කාර්ය වැඩ පිලිවෙලක් උදෙසා

24. කම්කරු පන්තියෙහි අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් ආර්ථික අර්බුදය වෙත යොමු වූ හදිසි වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස අපි බල කර සිටිමු. ආහාර බෙහෙත් හා නිවහන් අත්‍යවශ්‍යව ඇති අය සඳහා ඒවා සපයා දීමට ඩොලර් බිලියන සිය ගනන් මේ සඳහා වැය කල යුතුය. එක්සත් ජනපදය තුල පොදු කාර්ය වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය ය. කර්මාන්ත යලි ගොඩනැගීම, පාසල් හා සෞඛ්‍ය ආරක්ෂන පහසුකම් ප්‍රතිනිර්මානය කිරීම හා ඉතා වැදගත් සමාජ යටිතල පහසුකම් වැඩි දියුනු කිරීම, මෙම වැඩපිලිවෙලෙහි ක්ෂනික කාර්යයන් වනු ඇත.

25. සෑම කම්කරුවෙකුට ම සේවා නියුක්තිය හා යහපත් ජීවන තත්ත්වයන් සහතික කල යුතුය. කම්කරුවාගේ වැටුප ඔහුගේ මූලික අවශ්‍යතාවන්ගේ වටිනාකමට සම්බන්ධ දර්ශකයක් සම්පාදනය කල යුතුය. ඒ සමග ම, වැඩ කරන පැය ගනන් අඩු කල යුතුය. තම අවශ්‍යතාවන් පිරිමසාගැනීම සඳහා කිසිවෙකුට රැකියා කිහිපයක් කිරීමට සිදුවන තත්ත්වයක් ඇති නොවිය යුතුය. සියල්ලන්ටම ගුනාත්මකව ඉහල අධ්‍යාපනයක් සහතික කිරීම සඳහාත්; සාර්වත්‍රික හා පරිපූර්න සෞඛ්‍ය ආරක්ෂනය සැපයීම සඳහාත්; සුවදායක හා ඔරොත්තුදෙන නිවාස තැනීමට රාජ්‍ය සහනාධාර සහිත නිවාස ඉදිකිරීම්වලට අරමුදල් සැපයීම සඳහාත්; සියලු වැඩ කරන ජනතාවට යහපත් ආදායමක් ලැබෙන විශ්‍රාමික ආරක්ෂාවක් ලබා දීම සඳහාත්; කලාව, සංස්කෘතිය හා විද්‍යාත්මක පර්යේෂනවලට අරමුදල් ලබා දීම පුලුල් කිරීම සඳහාත්; දැවැන්ත ආයෝජනයක් කල යුතු යයි අපි දැඩි ලෙස කියා සිටින්නෙමු.

26.සියල්ලන්ට යහපත් රැකියා හා සමාජ වැඩපිලිවෙල් සැපයීම සඳහා "මුදල් නැත" යන්න ඇමරිකානු පාලක පන්තිය දශක ගනනාවක් පුරා කියා සිටින බොරුවයි. ආන්ඩුවේ සෑම වැඩ පිලිවෙලක්ම ඉතා තියුනු ලෙස පිරික්සීමට ලක් කල යුතු බවට බරාක් ඔබාමා දැන් අවධාරනය කරයි. පාලන තන්ත්‍රය විසින් බැංකුවලට ඩොලර් ට්‍රිලියන් ගනනින් මුදල් ගෙවීමෙන් අනතුරුව ඉදිරිපත් කෙරෙන මේ කපා හැරීම් දැනටමත් අගහිගකම්වලට ලක් කොට ඇති සමාජ වැඩපිලිවෙල් මත අතිශය ප්‍රබල බලපෑමක් ඇති කරනු ඇත.

## බැංකු හා ප්‍රධාන සංස්ථා ජනසතු කිරීම උදෙසා

27. එක්සත් ජනපදයෙහි ප්‍රතිපත්ති තීරනය කරන හා ගෝලීය වශයෙන් කොල්ලකෑමේ න්‍යාය පත්‍රයක් අනුගමනය කරන මූල්‍යමය කතිපයාධිපත්‍යයෙහි මාරාන්තික ග්‍රහනයන් බිඳ දැමීම මෙම වැඩපිලිවෙල සකස් කර ගැනීමෙහි ලා තීරනාත්මක වෙයි. පත් කරන කම්කරු පන්තියෙහි ප්‍රජාතන්ත්‍රීය පාලනය යටතේ විශාල මූල්‍යමය සංවිධාන ජනසතු කරන ලෙස අපි උදක්ම ඉල්ලා සිටිමු. කම්කරු පන්තිය විසින් නිර්මානය කරන ලද සමුච්ඡිත ධනය, බලගතු සමාජ අවශ්‍යතා සම්පූර්න කිරීමට වෙහෙස විය යුතුය. කම්කරුවන්ට හා කුඩා ව්‍යාපාරවලට ක්ෂනික නය සහන පිරිනැමීමෙහි ලා පූර්වාවශ්‍යතාව වනුයේ බැංකුවල පෞද්ගලික පාලනයට තිත තැබීමයි. නිවෙස්වල උකස් බේරාගැනීම අවුරාලීම ක්ෂනිව නතර කර දැමීම මෙන්ම නිවාස උකස්කරයන්, ශිෂ්‍ය නය, හා නයවර පත් මත කඳුගැසී තිබෙන නය විශාල වශයෙන් අඩුකිරීම සඳහා ක්‍රියාත්මක වැඩ පිලිවෙලක් යොදන ලෙස අපි උදක්ම ඉල්ලා සිටිමු. ආර්ථික දිවිය ප්‍රතිසංවිධානය කිරීම සඳහා විශාල සංස්ථා පොදු අයිතියට යටත් වූ ද, ප්‍රජාතන්ත්‍රීය පාලනයට යටත් වූ ද, ව්‍යවසායයන් බවට පරිවර්තනය කරන ලෙස අපි ඉල්ලා සිටිමු.

## සමාජ සමානතාව උදෙසා

28. සූරාකෑමෙහි හා පරපුටුබවෙහි වර්ධනයට සමාන්තරව, පසුගිය වසර 30 තුල සමාජ අසමානතාව අති විශාල ලෙස වර්ධනය වී ඇත. 1979 වසරට අනතුරුව, ඇමරිකානු ජනගහනයේ ධනවත්ම සියයට 1ක ජාතික වශයෙන් සිය පංගුව දෙගුනයකටත් වඩා වැඩි කර ගෙන තිබේ. එම කොටස සියයට 19ක සිට සියයට 40ක් දක්වා ඉහල ගොස් ඇත. ආර්ථික කඩාවැටීම මධ්‍යයෙහි වුවද, 2008 වසරේදී ඉහලම ඉදිරි සුරැකුම් කලමනාකරුවන් 25 දෙනා ඩොලර් බිලියන 11.6ක් උපයා ගත්හ.

29. ජනගහනයෙන් බහුතරයකගේ අයබදු අඩු කරන අතර ම, ධනවතුන්ගේ අයබදු තියුනු ලෙස වැඩි කිරීම ද ඇතුලුව, සමාජ සමානතාවය උදෙසා වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස අපි ඉල්ලා සිටිමු. සාපරාධී හා සමපේක්ෂන ක්‍රියාමාර්ග තුලින් ගොඩනගාගෙන ඇති ධනස්කන්ධය යලි අයකරගත යුතු ය. යෝධ සංස්ථාවල හා මූල්‍ය ආයතනවල පොත් පත් මහජන පරීක්ෂනය සඳහා විවෘත කල යුතුය. වංචනික ක්‍රියාවන් සම්බන්ධයෙන් වැරදිකරුවන් බවට පත් වූ පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරිය යුතුය.

## යුදවාදය හා යුද්ධය අවසන් කිරීම සඳහා

30. ඉරාක යුද්ධය ඇරඹීමෙන් පසුව දැනට සය වසරකට අධික කාලයක් ගතවී ඇත. මේ ආක්‍රමනයෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ඉරාක ජාතිකයන් දසලක්ෂ සංඛ්‍යාවකට වඩා මරුමුවට පත්වීමත් සමස්ත සමාජයක් ම විනාශයට පත්වීමත් මෙන් ම එක්සත් ජනපද සොල්දාදුවන් 4,000කට අධික සංඛ්‍යාවක් මරනයට පත්වීමත් ය. ඇෆ්ගනිස්තානයෙහි හා ඉරාකයෙහි යුදවැදීම තුලින් ඇමරිකානු මූල්‍ය හා සංගත ප්‍රභූව උත්සුක වන්නේ ඛනිජ තෙල් හා අනිකුත් ස්වභාවික සම්පත්වලින් පොහොසත් කලාපයන් මත සිය මිලිටේරි ග්‍රහනය තහවුරු කර ගැනීමටය.

31. ආර්ථික අර්බුදය තීව්‍රවත්ම එක් අතෙකින් ඇමරිකානු ධනවාදයෙහි දිගුකාලීන පිරිහීමත් අනෙක් අතට පාලක පන්තියෙහි නොසන්සිඳෙන අභිලාෂයනුත් අතර පරස්පරය මිලිටේරි ජයග්‍රහනය කරා ආයාසය තීව්‍ර කරනු ඇත. මෙය යුරෝපයෙහි හා ආසියාවෙහි සිය ප්‍රතිමල්ලවයන්ට එරෙහිව ඇමරිකානු අධිරාජ්‍යවාදය වැඩි වැඩියෙන් සිය සවිය උරගා බැලීමේ තත්ත්වයට පත් කරනු ඇත. ලෝකය නව ලෝක යුද්ධයක ව්‍යසනයට මුහුන දෙයි. මේ යුද්ධයෙහි නිරත වන්නේ න්‍යෂ්ටික අවි වලින් සන්නද්ධ බලවතුන් ය.

32. ඉරාකයෙන් හා ඇෆ්ගනිස්තානයෙන් සියලුම එක්සත් ජනපද හමුදා හා පෞද්ගලික කුලී හේවායන් ක්ෂනිකව හා කොන්දේසි විරහිතව ඉවත්කර ගන්නා ලෙසත් ලොව පුරා එක්සත් ජනපදය විසින් ගෙන යන මිලිටේරි ආක්‍රමනය අවසන් කරන ලෙසත් අපි බල කර සිටිමු. එක්සත් ජනපද යුද යාන්ත්‍රනය කඩා බිඳ දැමිය යුතුය. ඒ වෙනුවෙන් වැය කෙරෙන අති විශාල මුදල් සම්භාරය, ඇමරිකානු බෝම්බවලින් විනාශවුනු සමාජයන්ට වන්දි ගෙවීම සඳහාත් රට තුල බලගතු සමාජ අවශ්‍යතා සපුරා ලීම සඳහාත් උපයෝගී කර ගත යුතුය.

## ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම උදෙසා

33. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" නාමයෙන් වධහිංසා පමුනුවීම්, අනුවර්තනය කිරීම්, අනිශ්චිත කාල සීමාවන් තුල රඳවාගැනීම් හා රට අභ්‍යන්තරයේ ඔත්තු බැලීම් ඇතුලු ප්‍රජාතන්ත්‍රීය-විරෝධී පියවර මාලාවක් ඇමරිකානු ආන්ඩුව විසින් ගෙන තිබේ. මෙම ප්‍රතිපත්තිවල සැබෑ ඉලක්කය වනුයේ, එක්සත් ජනපදය තුල ඉස්මතුවන ප්‍රතිරෝධයන් ද ඇතුලුව, ඇමරිකානු පාලක පන්තියෙහි ප්‍රතිපත්ති කෙරෙහි දැක්වෙන ඕනෑම ප්‍රතිරෝධයක් මර්දනය කිරීම යි.

34. මෙම ක්‍රියාමාර්ග සියල්ල නිමා කරන ලෙසත් මූලික ප්‍රජාතන්ත්‍රීය හා ව්‍යවස්ථාමය අයිතීන් ප්‍රකෘතිමත් කරන ලෙසත් අපි ඉල්ලා සිටිමු. වධ හිංසා පමුනුවන ලෙස අනදුන් ආන්ඩුවේ ප්‍රධාන නිලධාරීන් අත් අඩංගුවට ගෙන ඔවුන්ට එරෙහිව නඩු පවරන ලෙසත් අපි ඉල්ලා සිටිමු. ඩිමොක්‍රැටික් පක්ෂයෙහි ප්‍රමුඛ පෙළේ සාමාජිකයින් ද ඇතුලුව, මෙම කටයුතු ගැන දැනුවත්ව සිටිමින් ඒවා රහස් ලෙස සඟවාගෙන සිටි සියල්ලන්ම මේ පිලිබඳව වගකීමට බැඳෙන පාර්ශවයන් ලෙස සැලකිය යුතුය.

## සමාජවාදී සමානතා පක්ෂය ගොඩනගන්න!

35. එක්සත් ජනපදයෙහි ද්වි-පාක්ෂික ක්‍රමය වූකලී එහි මූල්‍යමය හා සංගත ප්‍රභූව දේශපාලන ක්‍රියාවලිය පාලනය කිරීම සඳහා යොදාගන්නා දේශපාලන යාන්ත්‍රනයයි. ඔබාමා තෝරා පත් කර ගැනීම තුලින් සාමාන්‍ය ජනයාගේ උවමනාකම් ඉදිරියට ගෙන යා හැකිය යන මුලාව ප්‍රවර්ධනය කල "වාම" ප්‍රවනතාවන් යයි කියනු ලබන සියල්ලන්ගේ බංකොලොත් බව නව පාලන තන්ත්‍රයෙහි කටයුතු මගින් හෙලිදරව් කොට ඇත.

36. සිය ආසක්තයන් ඉදිරියට ගෙන යාමට නම්, කම්කරු පන්තියට ජාත්‍යන්තර හා සමාජවාදී මූලෝපායක් මත පදනම් වූ තමන්ගේ ම පක්ෂය, එනම්, සමාජවාදී සමානතා පක්ෂය, අවශ්‍යවේ. ස්ටැලින්වාදයට, වෘත්තීය සමිති නිලධාරි පැලැන්තියට හා කම්කරු පන්තිය ධනේශ්වර ක්‍රමයට හා එහි දේශපාලන නියෝජිතයන්ට ගැටගසා තැබීමට වැඩ කර ඇති සියලු ප්‍රවනතාවන්ට එරෙහිව, ජාත්‍යන්තර කම්කරු පන්තියෙහි ස්වාධීන අවශ්‍යතා වෙනුවෙන් සටන් කිරීමෙහි ලා අඛන්ඩ වාර්තාවක් සසප හා එහි පෙර ගමන්කරු වූ වර්කර්ස් ලීගය සතු ය.

37. සසපය ධනවාදය ප්‍රතිසංස්කරනය කිරීමට උත්සාහ නොකරන අතර කම්කරු ආන්ඩුවක් ස්ථාපිත කිරීම හා ලෝක ආර්ථිකයෙහි විප්ලවීය පරිවර්තනයක් ඇති කිරීම තුලින්, සමාජවාදී, ප්‍රජාතන්ත්‍රීය හා සමානාත්මතා ප්‍රතිපත්තිය මත පිහිටුවන ලද සමාජයක් නිර්මානය කිරීමට සටන් වදියි. එක්සත් ජනපදයෙහි හා ජාත්‍යන්තරව සමාජවාදය උදෙසා පොදු අරගලය තුල කම්කරුවන් එක්සත් කිරීමට අපි උත්සුක වෙමු - ඒ, සමානතාව හා පෘථිවි ගෝලයෙහි ධනය තාර්කික හා ප්‍රජාතන්ත්‍රීය ලෙස උපයෝගි කර ගැනීම සඳහා ය.

38. එක්සත් ජනපදය පුරා ද ජාත්‍යන්තරව ද කම්කරුවන් හා තරුනයින් වෙත මෙම සම්මේලනය ඉතා හදිසි ආයාචනයක් කර සිටීඃ හතරවැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, සමාජවාදී සමානතා පක්ෂය හා එහි ශිෂ්‍ය සංවිධානය වන සමාජවාදී සමානතාව වෙනුවෙන් ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ගොඩ නගන්න! සමාජවාදය සඳහා සටන භාරගන්න!

© www.wsws.org